# කෙසෙල් පැළ පහසුවෙන් නිපදවා ගන්න

දැනට කෙසෙල් වගාවේ නිරතවූවන් හා උනන්දුවක් දක්වන අයට ඇති විශාලම ගැටළුවක් වන්නේ නිරෝගී කෙසෙල් පැළ ලබා ගැනීමට ඇති දුෂ්කරතාවයි. ඔබ සතුව නිරෝගී කෙසෙල් පඳුරු කිහිපයක් තිබේනම් එමගින් කෙටි කාලයකදී විශාල පැළ සංඛ්‍යාවක් නිපදවා ගත හැකි බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සොයාගෙන තිබේ.

මේ සඳහා පළමුවෙන්ම මාස 5-6 පමණ වයස්ගත වූ නිරෝගී කෙසෙල් ගසක් තෝරා ගන්න. ඉන් පසු පොළොව මට්ටමින් සෙ.මී. 5ක පමණ උසකින් කඳ කපා දමන්න.

මේ අන්දමට කඳ කපා දැමූ කෙසෙල් ගසෙහි මැදින් නැවත ගොබය වැඩීමට ඉඩ ඇත. මෙය වළකාලීම සඳහා කැපුම් පෘෂ්ඨයෙහි මැද ඇති අංකුරය පිහියකින් හෝ ලී උලකින් තලා දමන්න. ඉන්පසු මෙම කැපුම් පෘෂ්ඨය වැසී යන පරිදි සෙ.මී. 10-15 උසට පස්වලින් වසන්න.

දින 7-10 ගතවූ පසුව මෙම ස්ථානයේන් මොරෙසියන් හට ගැනීම ආරම්භ වේ. කෙටි කාලසීමාවකදී දිරිමත් පැළ සංඛ්‍යාවක් ලබා ගැනීම සඳහා මෙම ස්ථානයට ජලය සැපයීම සහ නිර්දේශිත පරිදි කෙසෙල් වගාවට රසායනික පොහොර යෙදීම වැදගත් වේ. කෙසෙල් වර්ගය අනුව මේ අන්දමට සකස් කරගත් කෙසෙල් ගසකින් මාස 1 1/2 පමණ ගතවූ පසුව එම ස්ථානයෙන් හටගන්නා කෙසෙල් පැළ සිටුවීමට සුදුසු තත්ත්වයකට පත්වේ.

සරත් විජයගුණවර්ධන